# ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රස්ථානය සමඟ එක්වීමට ඔබටත් අනගි අවස්ථාවක්



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමණාකරන සහකාර පංතියේ කණිෂ්ඨ පෞද්ගලික සහකාර තනතුරට වසර දෙකක පරිවාස කාලයකට යටත්ව බඳවා ගැනීමට සළකා බැලීම සඳහා පහත දැක්වෙන සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. කණ්ඩායම් හැඟීමෙන් සහ කැපවීමෙන් සේවය කිරීමට කැමති පුද්ගලයන් සඳහා මෙම තනතුර විවෘතය.

## කණිෂ්ඨ පෞද්ගලික සහකාර තනතුර (ඉංග්‍රීසි සහ සිංහල)

**1. නිපුණතාවයන්**

විශිෂ්ට සන්නිවේදන සහ සංවිධාන හැකියාවන්ගෙන් යුක්ත වීම, සිංහල හා ඉංග්‍රීසි භාෂාවන් දෙකම ප්‍රවීණ ලෙස හැසිරවිය හැකිවීම, MS Word, MS Excel හා MS Power Point වැනි කාර්යාල කටයුතු සඳහා භාවිතා කරනු ලබන පරිඝණක මෘදුකාංග (Office Applications) මනා ලෙස හැසිරවිය හැකිවීම, අවස්ථානුකූලව ප්‍රමුඛතාවය අනුව වැඩ කිරීමේ හැකියාව සහ පෞද්ගලික සහකාර තනතුරට අවශ්‍ය අනෙකුත් පොදු නිපුණතාවයන්ගෙන් යුක්ත වීම.

**2. වගකීම්**

රහස්‍යභාවය ඉහළ මට්ටමෙන් රැකගැනීමේ හැකියාව, ආයතනයට ඇති පක්ෂපාතීත්වය හා කලට වේලාවට වැඩ කිරීමේ හැකියාව, විවිධ අවස්ථා සම්බන්ධීකරණය කිරීමේ හැකියාව හා ඒ අනුව දින පොත නඩත්තු කිරීම, අභ්‍යන්තර හා බාහිර පාර්ශ්ව සමග සම්බන්ධීකරණය කිරීම, ස්වාධීනව ලිපි කටයුතු පිළියෙල කිරීමේ හැකියාව, අනුලියනය හා යතුරු ලියනය සහ ලේකම් කාර්යයන්ට අදාල වගකීම් දැරීමේ හැකියාව.

**3. අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද**

- **අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන් ඇතුළුව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ සහිතව ගණිතය විෂයය ඇතුළුව අවම වශයෙන් විෂයයන් හයක් (06) සමත්ව තිබීම

**සහ**

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවක් යටතේ අවම වශයෙන් ප්‍රධාන විෂයයන් තුන (03) එක් වරක දී සමත්ව තිබීම

- **වෘත්තීය සුදුසුකම්**

මහ බැංකුවට පිළිගත හැකි ආයතනයකින් ඉංග්‍රීසි සහ සිංහල යතුරුලියනය (Typewriting) පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව අවසන් කර තිබීම.

- **පළපුරුද්ද**

පිළිගත් ආයතනයක ඉංග්‍රීසි සහ සිංහල යතුරුලියනය (Typing) පිළිබඳ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් තිබීම සහ MS Office පැකේජය මනා ලෙස හැසිරවිය හැකිවීම. ලේකම් කාර්යයන්වල පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.

**4. පහත සඳහන් අමතර සුදුසුකම් සපුරා තිබීම වඩාත් යෝග්‍ය වේ.**

මහ බැංකුවට පිළිගත හැකි ආයතනයකින් ලඝුලේඛනය (Shorthand) පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව අවසන් කර තිබීම, දෙමළ භාෂාවෙන් කටයුතු කිරීමේ හැකියාව

**5. වයස**

**2022.05.25** වන දිනට වයස **අවුරුදු 35 ට** නොවැඩි විය යුතු ය.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්දට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය. එම සහතිකවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**6. වැටුප් හා අනෙකුත් දීමනා**

ආකර්ෂණීය වැටුපක් සමග මාස දෙකක දළ වැටුපට සමාන වාර්ෂික විශේෂ දීමනාවක්, අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය, වෛද්‍ය පහසුකම් හා සේවක ණය පහසුකම්, විශ්‍රාම ප්‍රතිලාභ සහ පුහුණුවීම් අවස්ථා

### තෝරා ගැනීමේ පිළිවෙල

මේ සම්බන්ධයෙන් පවත්වනු ලබන නිපුණතා පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු මත පදනම්ව අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසන් තෝරා ගැනීමේ දී නිපුණතා පරීක්ෂණයේ දී සහ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවයන්ට සමාන බරතැබීමක් සිදු කරනු ලබයි. නිපුණතා පරීක්ෂණයේ සියලු ප්‍රශ්නපත්‍ර ඉංග්‍රීසි මාධ්‍යයෙන් සපයනු ලබන අතර යතුරුලිවීමේ හැකියාව ඉංග්‍රීසි සහ සිංහල යන මාධ්‍යය දෙකෙන්ම පරීක්ෂා කරනු ලැබේ. සිංහල යතුරු ලියනය සඳහා "Iskoola Pota" අක්ෂර ශෛලිය භාවිතා කළ යුතු වේ.

### අයදුම්පත්

මහ බැංකුවේ වෙබ් අඩවිය වන http://www.cbsl.gov.lk මගින් නියමිත අයදුම්පත් අකෘති පත්‍රය ලබා ගත හැකිය.

නියමිත ආකෘති පත්‍රයට අනුව සකස් කළ සියලු ලිපි ලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත්වල පරිලෝකනය කරන ලද (Scanned) පිටපත් අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ **hrd_recruitment@cbsl.lk** යන විද්‍යුත් ලිපිනයට, 2022.05.25 දිනට හෝ ඊට පෙර යොමු කළ යුතු ය.

"කනිෂ්ඨ පුද්ගලික සහකාර තනතුර (ඉංග්‍රීසි සහ සිංහල) සඳහා ඉල්ලුම් පත්‍රය" යන වචන විද්‍යුත් තැපෑලෙහි විෂය ලෙස සඳහන් කළ යුතු ය.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ නියමිත අකෘතියෙන් බැහැර වූ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සපුරා නොමැති තැනැත්තන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයේ දී අදාල සහතිකපත්‍ර වල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා පත් කර ගනු නොලබයි.

තෝරා ගැනිම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය. නිපුණතා පරීක්ෂණය හෝ සම්මුඛ පරීක්ෂණ/ය සඳහා කැඳවීමේ දී අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික සුදුසුකම්වලින් ආවරණය වන විෂයය ක්ෂේත්‍රයන්හි අදාළබව සහ බැංකුවේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ඔවුන්ගේ සේවා පළපුරුද්දෙහි අදාළබව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය.

**අධ්‍යක්ෂ-මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**
**දුරකථන : 0112477330 ෆැක්ස් : 0112477715**